# 24 අත්දැකීම් ප්‍රතිනිර්මාණය

සාහිත්‍ය කලා නිර්මාණයකින් සිදු කෙරෙන්නේ නිර්මාණකරුවා විසින් අත්විඳින ලද හැඟීම් හා සමාන මානසික තත්ත්වයක් ඒ නිර්මාණය ආස්වාදනය කරන්නාගේ මනසෙහි ද ජනිත කිරීමේ කාර්යයකැයි සැලකේ. කලාකරුවකු නිර්මාණයකට පාදක වන හැඟීම නැත හොත් අත්දැකීම ලබා ගන්නේ යම් වස්තුවක්, අවස්ථාවක්, සිද්ධියක් පදනම් කර ගනිමින් එය ස්වකීය බුද්ධි මහිමයෙන් අවබෝධ කර ගැනීමෙනි. ඇතැම් විට එම අවබෝධය, තර්කඥානය ඉක්මවා ගිය තත්ත්වයක් විය හැකි ය. විචාරකයන් විසින් 'අන්තර්ඥානය' යනුවෙන් හඳුන්වනු ලබන්නේ මේ ශක්තිය යි. කලා නිර්මාණයක් බිහි කිරීමට මෙන් ම එය ආස්වාදය කිරීමට ද මේ තත්ත්වය අවශ්‍ය වන බව පෙන්වා දෙනු ලැබේ. විවිධ කලාකරුවන් විසින් විඳින ලද අත්දැකීම් පදනම් කර ගනිමින් කලා නිර්මාණ බිහි කිරීම සිදු කළ ආකාරය පිළිබඳ විවරණයක් මේ පාඩමෙන් ඉදිරිපත් කෙරේ. එය සකස් කර ඇත්තේ මහාචාර්ය විමල් දිසානායකගේ නිර්මාණය හා විචාරය, මහාචාර්ය ඒ. වී. සුරවීරගේ නිර්මාණ පසුබිම යන ග්‍රන්ථ ඇසුරිනි.

අපි විවිධ දේ අනුභව කරමු; භුක්ති විඳිමු. සාහිත්‍ය කෘතියක් නිර්මාණය කරන ලේඛකයා මෙන් ම වෙනත් කලා නිර්මාණයක් බිහි කරන නිර්මාණකරුවා ද තම නිර්මාණයට පාදක කර ගන්නේ තමන් විසින් විඳින ලද, අත්දකින ලද නැත හොත් මනසින් ග්‍රහණය කර ගන්නා ලද දෑ ය; නැත හොත් කිසි යම් සිද්ධියකට හෝ අවස්ථාවකට සම්බන්ධ වීමෙන් හෝ නිරීක්ෂණය කිරීමෙන් ඔහු ඒ සිද්ධිය හෝ අවස්ථාව පිළිබඳ ලබා ගන්නා අවබෝධය ය. උසස් සාර්ථක කලාකරුවා තමා, අත්විඳින ලද දෙය ඒ ආකාරයෙන් ම ඉදිරිපත් නො කරයි; ඔහු ඒවා වින්දනාත්මක අර්ථයක් ජනනය වන පරිදි ප්‍රතිනිර්මාණය කරයි. එමගින් තමන් ලැබූ වින්දනය අන්‍යයන්ට ද ලබා දීම ඔහුගේ කාර්යය වේ. පාඨකයා ද සාහිත්‍ය නිර්මාණයක් පරිශීලනය කරනුයේ තමන් මීට පෙර අත් නො විඳි අන්දමේ, එනම් අපූර්ව අත්දැකීමක් විඳ ගැනීමේ අරමුණෙනි.

සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය හෙළි වන්නේ ඔහු සිය නිර්මාණය සඳහා අර්ථවත් අත්දැකීම් තෝරා ගැනීම හා ඒ අත්දැකීම පාඨකයාට වින්දනයක් ඇති වන ආකාරයෙන් නැවත ඉදිරිපත් කිරීම සිදු කර ඇති අන්දම අනුව ය. ඔහු තමා අත්දුටු දෙය ඒ ආකාරයෙන් ම ඉදිරිපත් නො කරයි. සිතින් මවා ගත් යම් ප්‍රමාණයක් ද ඊට එක් කරයි. සිතින් මවා ගැනීම පරිකල්පනය යනුවෙන් හඳුන්වනු ලැබේ. එහෙයින් හොඳ කලා නිර්මාණයක් බිහි වන්නේ අත්දැකීම්වල මෙන් ම පරිකල්පනයේ ද සංකලනයෙන් බව කිව හැකි ය. හොඳ කලාකරුවාගේ කාර්යය සත්‍යය ඉදිරිපත් කිරීම යැයි පිළිගැනේ. එහෙත් ඔහු ඉදිරිපත් කරන්නේ "සත්‍යය" නො ව "සත්‍යයේ මායාව" බව විචාරකයෝ පෙන්වා දෙති. මේ තත්ත්වය ඇති වන්නේ කලාකරුවා තමා ඇසූ දුටු සියල්ල ඒ ආකාරයෙන් ඉදිරිපත් නො කර ඒ ඇසුරෙන් සිදු වීමට ඉඩ ඇති, සිදු විය හැකි දෙයක් නිර්මාණය කරන බැවිනි.

අත්දැකීමක් යනු හුදු කතා පුවතක් පමණක් නො වේ. කතා පුවතකින් තොර වූ හැඟීම් සමුදායක් ද ඇතැම් විට නිර්මාණකරුවකුගේ අත්දැකීමක් බවට පත් විය හැකි ය. කතා පුවතක් ගැබ් නො වුණු ඇතැම් කාව්‍ය නිර්මාණයකින් ද අප ආස්වාදයක් ලබන්නේ එහි කතා පුවතක් නැතත් කාව්‍යමය අත්දැකීමක් අන්තර්ගත වන බැවිනි. මේ අත්දැකීම කිසියම් විචාරාත්මක අදහසක් වීමට ද පුළුවන. කතා පුවතක් ඇතත් නැතත් හොඳ නිර්මාණයකට පාදක වන අත්දැකීම අපූර්ව හෙවත් මින් පෙර නුවූ විරූ එකක් විය යුතු ය. එමෙන් ම එහි අර්ථාන්විතභාවයක් ද ගැබ් වීම අත්‍යවශ්‍ය ය; නිතර දෙවේලේ අසන්නට දකින්නට ලැබෙන සුලබ පුවතකින් ආස්වාදයක් නො ලැබෙන බැවිනි. එමෙන් ම එම අත්දැකීම විශ්වසනීයත්වයෙන් යුක්ත වීම ද අවශ්‍ය වේ. එනම් මෙලොව සිදු විය හැකි දෙයක් සේ පෙනී යෑම යි. කලාකරුවකු ඉදිරිපත් කරන දුර්ලභ ගණයේ අත්දැකීමක් අස්වාභාවික හෝ අභව්‍ය සිද්ධිවලින් යුක්ත වේ නම් එයින් ගැඹුරු අරුතක් පළ නො වේ. එබැවින් කලාකරුවා අත්දැකීම් අතුරින් තෝරා ගත යුත්තේ ඒ ඒ සිද්ධියට, අවස්ථාවට, චරිතයට අතිශයින් ම අදාළ හා උචිත දෑ පමණකි. අප කියවන්නේ හෝ අසන්නේ හෝ නරඹන්නේ හෝ කල්පිතයක් බව අපි දනිමු. අප විඳින්නේ සිදු වූ දෙය නො ව ලොව සිදු විය හැකි දෙයක් බව අපි දනිමු. එයින් අපට ආස්වාදයක් ලැබිය හැක්කේ කලාකරුවා උචිත හා අදාළ දේ පමණක් තෝරා ඔහුගේ පරිකල්පනයෙන් ඒවා විචිත්‍රවත් කොට ඉදිරිපත් කර ඇති බැවිනි.

කලාකරුවා සිය අත්දැකීම් ප්‍රකාශ කිරීමේ දී ඒවා ඉදිරිපත් කළ යුත්තේ අත්දැකීමෙන් ඈත් වී එය විග්‍රහ කරමින් බව විචාරක මතය යි. එසේ නො වූ කල බිහි වන්නේ නව නිර්මාණයක් නො ව සිදුවීම් සමූහයක වාර්තාවක් පමණකි.

කලාකරුවා විසින් විඳින ලද දෙය ඇසුරින් කරන ලද නිර්මාණය පරිශීලනය කරන පාඨකයාගේ හෝ ප්‍රේක්ෂකයාගේ හෝ ශ්‍රාවකයාගේ හෝ මනසෙහි ද කලාකරුවා විසින් විඳ ගන්නා ලද අනුභූතිය ඒ ආකාරයෙන් ම ජනිත වන බව අපේක්ෂා කෙරේ. මේ තත්ත්වය සහානුභූතිය යනුවෙන් හැඳින්වේ. සහානුභූතිය යනු කලාකරුවාගේ සිතුම් පැතුම් හා ආකල්ප සමඟ සමාන තත්ත්වයකට පත් වීමකි. එහි ලා නිර්මාණය පරිශීලනය කරන්නා හා නිර්මාණකරුවා සමඟ අදහස් අතින් සමපාත වීමක් සිදු වෙතැයි අපේක්ෂා කෙරේ. මේ හේතුවෙන් උසස් රසිකයා, කලාකරුවා හා සමාන මානසික මට්ටමක් ඇතැයි යන අදහසින් සහෘදයා (සමාන හෘදයක් හෙවත් එක සමාන වින්දන මට්ටමක් ඇති තැනැත්තා) යනුවෙන් හැඳින්වෙයි.

අපේ ප්‍රවීණ ලේඛකයන් කිහිප දෙනෙකු ඔවුන්ගේ නිර්මාණ හා ඒවාට පාදක වූ අත්දැකීම් සම්බන්ධයෙන් ගෙන හැර පා ඇති තොරතුරු සමහරක් පහත දැක්වෙයි. සිය අත්දැකීමක් අන්‍යයන් සසල කරවන නිර්මාණයක් බවට පත් කර ඇත්තේ කෙසේ දැයි ඔබට එයින් වටහා ගත හැකි වනු ඇත.

මගේ 'වහල්ලු' කෙටිකතාව ලියන්ට මගේ කල්පනාව පිබිදුණේ මෙසේ යිඃ අවුරුදු හතළිහකට පමණ පෙර මා ගල්කිස්සේ පදිංචි ව සිටි කාලයේ වඩාත් කාලය ගත කළේ කෙටිකතා ලියන්ට යි. කෙටිකතාවලට වස්තු සොයන්ට හිසට වද දෙන ඒ කාලයේ දවසක මා හවස් වරුවේ ගෙදර බලා ගමන් කළා. මගේ ගෙදරට අල්ලපු ඉඩම හිස් එකක්. එහි මහලු ගවයකු බිම ලැග විට සපමින් සිටිනු මා දුටුවා. එකෙණෙහි ම මට මතක් වුණා මා කුඩා කල දැන සිටි අල්ලිස් නමැති කරත්තකාරයෙක්. ඔහු ඉරිදා සෙනසුරාදා හැර අනික් දවස්වල කොග්ගල ඔයේ පාලම අසලට තිරික්කලය ගෙන ගොස් මඟීන් තුන් දෙනෙකු පටවා ගෙන ගාලු නගරයට ඇතුළු වන කඩවතට යනවා. ඔහුගේ තිරික්කලය ගාලු නගරයට දක්කා ගෙන යන්ට ඔහුට ලයිසන් පත්‍රයෙන් ඉඩ දී නැත. නගරයේ කුලී කරත්තයකට ලයිසන් ගැනීමට රුපියල් විස්සක් තිහක් වැඩිපුර ඕනෑ. අල්ලිස් කියන මිනිහා හවස ගාල්ලේ කඩවත සිට කොග්ගලට හා කතළුවට ආපසු යන මඟීන් තුන් දෙනෙකු තිරික්කලයේ පටවා ගෙන ගමට යනවා. ඔහු ජීවිකාව සපයා ගත්තේ තිරික්කලයේ මඟීන් පටවා ගෙන ගාල්ලට යෑමෙන්.

අල්ලිස් පිළිබඳ මගේ අත්දැකීම එපමණ යි. ඒ අත්දැකීම ඇසුරෙන් රචනා කළ 'වහල්ලු' කතාවේ අල්ලිස්ගේ චරිතය ශෝකාන්ත අමුතු නිර්මාණයක්. ඒ නිර්මාණය සඳහා මා ජීවන තොරතුරු සොයා ගත්තේ මගේ අත්දැකීම් කුණුගොඩ ගැරීමෙන්. ඔහු තිරික්කලයෙන් වැටී කොන්ද කැඩී හැම දා ලෙඩකු ලෙස ජීවත් වුණා. සනීපයෙන් සිටිය දී ඔහු නිදා ගත්තේ ඉස්තෝප්පුවේ වූ ඇඳේ. අසනීප වූ පසුත් ඔහුට ඒ ඇබ්බැහිකම හරින්ට බැරි වුණා. ඔහුගේ ගොනා පිං ගොනෙකු වුණා. ඒ කාලයේ හැම ගමක ම පිං ගොනුන් හිටියා. වැඩ ගෙන මහලු වූ හරකුන් ගැමියන් මස්කඩකාරයන්ට වික්කේ නැහැ. උන් තැනින් තැන පිටිවල ඇවිද තණ කා අගලකින් වතුර බී ජීවත් වුණා.

ගැමියන් සමහර විට මේ පිං ගොනුන් අල්ලා කාගෙන් වත් ණයට ඉල්ලා ගන්නා කරත්තයක බැඳ පොල් ලෙලි හෝ පොල් අද්දනවා. හවසට උංට පුනක්කු ටිකක් බොන්ට දී අත හරිනවා. ගමේ කාටත් අයිති නිසා ගැමියන් එවැනි හරකුන් හැඳින්වූයේ පිං ගොනුන් ලෙස. මගේ 'වහල්ලු' නමැති කතාව ලියන්ට අරමුණ නොහොත් වස්තු බීජය සොයා ගත් සැටිත් ඒ වස්තු බීජය විකාසනයෙන් එය ශෝකාන්ත නිර්මාණයක් කරනු සඳහා මගේ ගැමි අත්දැකීම්වලින් උචිත දේ ගරා තෝරා ගත් සැටිත් යට කියන ලද කරුණුවලින් හෙළි වෙයි.

මගේ කෙටිකතා අතර ඉතා ප්‍රසිද්ධ කතාවක් තමයි 'වෙසක් පහන'. එය හොඳ කතාවක් බව කවුරුත් පිළිගන්නවා. ඔබ කැමති ඇති ඒක ලියූ ආකාරය දැන ගන්ට. ඇත්ත කියනවා නම් මම ළමයින්ට ඒ තරම් ප්‍රිය කරන්නෙ නෑ. අඹු දරුවන් සහිත පවුල් ජීවිතයක් ඇතිව දරුවන් සුරතල් කරන්ට මගේ ආසාවක් තිබුණේ නෑ. මම පුංචි කාලේ මගේ වැඩිමල් සහෝදරයා වෙසක් කූඩුවක් තනනවා මම බලාගෙන හිටියා. මේ අත්දැකීමෙන් තමයි මම 'වෙසක් පහන' ලියුවෙ. නමුත් අත්දැකීමෙන් ලැබුණ දෙයක් ම නො වෙයි. කොටින් කියනවා නම් ඒ කතාවේ තියෙන්නේ පට්ටපල් බොරුවක්. මම කවදාවත් වෙසක් කූඩුවක් හදලා නැහැ. හැදූ බවක් මට නම් මතක නෑ.

කතාවක් ලියන හැම ලේඛකයෙකුට ම තියෙනවා යම් කිසි අරමුණක්, පරමාර්ථයක්. තමන් ලියන කතාවෙන් ලේඛකයා ඒ අරමුණ ඉටු කර ගන්නවා. මේක සමහර විට විචාරකයින්ට තේරෙන්නේ නැහැ. මගේ 'ගමන' නම් කෙටිකතාව ගනිමු. ඒ කතාවෙන් කියන්නේ ගම්බද පොහොසත් පවුලක් ගැන. මේ කතාව ලියුවේ ඒ පවුලේ උපන් දරුවෙකුට තමන්ගෙ තත්ත්වය පෙනෙන හැටි කියන්ට. ඒ ළමයාගේ මවුපියන් මිය ගොස් වැළලූ සැටි කීමෙන් කතාව කෙළවර කළ හැකියි. එතනින් කතාව නො නවත්වා තව දුර ලියුවේ ඇයි? මට තවත් කාරණා කියන්ට ඕනෑ වුණා. දරුවාගේ පවුලේ තත්ත්වය, දෙමවුපියන්ට ඇති ආදරය, ගෞරවය විතරක් නො වෙයි ආත්මානුකම්පාව වැනි දේ කීමත් මගේ අරමුණක් වුණා. දෙමවුපියන්ගේ භූමදානයෙන් කතාව අවසන් කරන්ට තිබුණා. එතකොට මගේ අනික් අරමුණ ඉටු වෙන්නේ නැහැ. කුඩා දරුවා දුක් වින්ද සැටි, ඔහු ලොකු වී තම මවුපියන්ගේ මිනී වළවල් වෙත ගොස් වැන්ද සැටි, මේ ආදිය කියුවේ මගේ දෙවන අරමුණ ඉටු කර ගන්ටයි. විචාරකයන් මොනවා කීවත් කතාව සම්පූර්ණ වන්නේ මේ ආකාරයෙන් බවයි මගේ පිළිගැනීම.

සාහිත්‍ය නිර්මාණ ශක්තිය දෙයාකාරයකින් ඇති වෙනවා. මෙහෙම හිතමු. අඹ ගහක අඹ මල් පිරී තියෙනවා. ලේඛකයා අඹ මල් දකිනවා. මොහුට පෙනෙන්නෙ එක විදියකට. ජීව විද්‍යාඥයාත් මේක බලනවා. ඔහුට පෙනෙන්නේ වෙනත් පැත්තක්. වඩුවෙක් අඹ ගහ දිහා බලනවා. එයාට පෙනෙන්නේ ගහේ දැව දඬුවල වටිනාකම. ලේඛකයා තම සිතේ ඇති කර ගත් හැඟීම, ඔහුගේ අවබෝධය, සත්‍යය කතාවෙන් කියවෙනවා. ඒක ජීවිත සත්‍යයක්. එදිනෙදා දකින සත්‍යය.

බොහෝ කතා අපේ හිතට එන්නේ කෙසේ ද කියලා ප්‍රශ්නයක් අහන්ට පුළුවන්. ඒ කොහොම ද කියා හරියට කියන්ට බෑ. සමහර විට ක්ෂණිකව අහසින් හෙණ ගෙඩියක් එන්නා වාගෙ. අපට නො දැනෙන හැඟීම් තියෙනවා අප තුළ. ආසාවල් තියෙනවා. මේවා කොතන තියෙනවා ද කියා කියන්ට බෑ. අවිඥානිකව පහළ වෙනවා කියලා හිතන්ටත් පුළුවනි. එදිනෙදා ජීවිතේ අත්දැකීම් ඇති වෙනවා. අපි හිතමු මිනිහෙක් කෙනෙකුට තඩිබානවා. නැත්නම් අම්මා කෙනෙක් දරුවෙක් මැරිලා අඬනවා. ළමයෙක් කාර් එකක හැපෙනවා. මේ ඔක්කොම සමාජ අත්දැකීම්. මේ අනුව අපේ අත්දැකීම් කොටස් දෙකකට බෙදන්ට පුළුවනි. පුද්ගල අත්දැකීම් හෙවත් ලේඛක අත්දැකීම් එක් කොටසක්. අනෙක් කොටස තමා සමාජ අත්දැකීම්. මේ අත්දැකීම් දෙවර්ගයෙන් ම ලේඛකයා ප්‍රයෝජන ගන්නවා. නිර්මාණ කිරීමට මේ අත්දැකීම් පමණක් මදි. පුළුවන් තරම් පොත් කියවලා දැනුම ලබා ගන්ට ඕනෑ.

ඉහත පළමු උද්ධෘතය, මාර්ටින් වික්‍රමසිංහගේ වහල්ලු කෙටිකතාව නිර්මාණයට පාදක වූ අත්දැකීම විස්තර කරන්නකි. දෙවැන්නෙන් කියැවෙන්නේ ජී. බී. සේනානායකගේ 'වෙසක් පහන' හා 'ගමන' යන කෙටිකතාවලට පාදක වූ අත්දැකීම් පිළිබඳව කරන ලද විවරණයකි.

මහගම සේකර ස්වකීය කාව්‍ය නිර්මාණ කිහිපයකට පාදක වූ අත්දැකීම් සම්බන්ධයෙන් කළ විවරණයක් පහත දැක්වෙයි.

දැන් මගේ කවි ම උදාහරණයට ගත හොත්, මා තෝරා ගෙන කියන හඳ සහ නිව්යෝර්ක් නුවර කියන කවි පංතිය මා කෙළින් ම ලබා ගත් අත්දැකීමක්, මට සිදු වූ දෙයක් ලෙස හඳුන්වන්ට පුළුවනි. ඒ වගේ ම 'මක් නිසා ද යත්' පොතේ එන බොහෝ දේවල් මා ලැබූ අත්දැකීම් බව කියන්ට ඕනෑ. හැබැයි ඒ පොතේ මගේ හැබෑ අත්දැකීම් පමණක් නො වෙයි යම් යම් අයගේ, වෙනත් පුද්ගලයන්ගේ අත්දැකීම් මගේ අත්දැකීම් බවට පත් කර ගත් අවස්ථාත් තියෙනවා. ඒවා අනුන්ගෙන් ලබා ගත් අත්දැකීම් වුණත් මගේ අත්දැකීම් බවට පත් කර ගෙනයි ඇතුළත් කළේ. වෙන වෙන අයට වෙච්චි සිද්ධි, අපේ නෑදෑයන්, මවුපියන්, අසල්වාසීන්, එහෙමත් නැත්නම් කවදා වත් නාඳුනන පුද්ගලයන් හා සම්බන්ධ සිද්ධි තියෙනවා. වෙන වෙන අයට වෙච්චි දේවල් කවියාගේ අත්දැකීම් කර ගත්ත අවස්ථා තියෙනවා. **බෝඩිම** පොතේ එන 'බෝඩිම' නම් කවි පංතිය, එහෙම නැත්නම් **රාජතිලක ලයනල් සහ ප්‍රියන්ත** පොතේ එන චරිත වගේ දේවල් කෙළින් ම මා ලබාපු අත්දැකීම් හැටියට සලකන්ට පුළුවන් කමක් නෑ. මා දන්නා අඳුනන යම් යම් පුද්ගලයන්ගේ චරිත ආශ්‍රයෙන් ගොඩ නැගූ දේවල් ඒ පොත්වල තියෙනවා.

තමා කෙළින් ම ලැබූ අත්දැකීම් වෙන්ට පුළුවන්. තමා ආශ්‍රය කරන යම් යම් පුද්ගලයන් දිහා බලලා ඔවුන්ගෙන් ලබාපු අත්දැකීම් වෙන්ට පුළුවන්. එහෙමත් නැත්නම් පොත්පත් කියවීමෙන් අත්දැකීම් ලබා ගන්ටත් පුළුවන්. චිත්‍රපටි බැලීමෙන් අපට අත්දැකීම් ලැබෙනවා. මේවා සමහර විට කාව්‍යයේ වස්තු බීජය වෙන්ට පුළුවන්.

මගේ **බෝඩිම** කවි පොතේ තියෙන 'මාර යුද්ධය' කියන කවි පෙළ. නැත්නම් **සක්වා ලිහිණි** නම් පොතේ එන 'බුද්ධත්වය' කියන කවි පංතිය ගනිමු. මේ කවි පංතිවල තියෙන්නෙ බුදුන් වහන්සේගේ චරිතයේ යම් යම් අවස්ථා පොත පතින් කියවලා දැන ගෙන අලුත් විදියකට ඉදිරිපත් කිරීමක් බව කියන්ට ඕනෑ. උදාහරණයක් වශයෙන් අපි දන්නවා මේ මාර යුද්ධය පොත්වල විස්තර කරලා තියෙන්නෙ කොහොම ද කියන කාරණය. වසවර්ති මාරයා බුදුන් ඉදිරියට ඇවිත් ලොකු යුද්ධයක් කරලා තියෙනවා. අර තණ්හා, රතී, රඟා කියන මාර දූන් තුන්දෙනා ඇවිත් නටලා බුදුන් වසඟ කර ගන්ට හැදුවා ලු. 'මාර යුද්ධය' කියන කවි පංතියේ දී මා කර තිබෙන්නේ මේ කාරණා වෙනත් ආකාරයකින් ඉදිරිපත් කිරීම යි. මේ සිද්ධි දිහා මා බැලුවේ වෙනස් ආකාරයකින්.

සිද්ධාර්ථ කුමාරයා මහබිනික්මන් කරලා තවුස් දම් පුරන කාලයේ තමන්ගේ ගෙදර දොර ජීවිතය ගැනත් මතක් වෙනවා. තමන්ට ඉතා ආදරයෙන් ජීවත් වූ යශෝධරා බිසව ගැන මතක් වෙනවා. ඇගේ ගුණ යහපත්කම්, පති භක්තිය, උතුම් චරිතය ආදි දේ සිහිපත් වීම නිසා භාවනාවට හිත එකඟ කර ගන්ට අමාරු වෙනවා. මේ වාගේ දේවල් තමා මාර යුද්ධයෙන් මා ඉදිරිපත් කරලා තියෙන්නෙ. සංකේත හෙමත් යොදලා තියෙනවා. මේ හැටියට අපට පොතින් පතින් අත්දැකීම් ලබා ගත හැකියි. මීට අමතරව පොදු සමාජයේත් අත්දැකීම් තියෙනවා. මේවා සමාජ අත්දැකීම් කියලා නම් කරන්ට පුළුවනි...

...'රාජතිලක ලයනල් සහ ප්‍රියන්ත' පොතේ රාජතිලකගේ චරිතය නිර්මාණය කිරීමේ දී මූලික වශයෙන් නම් මට මතක් වුණේ අපේ පළාතෙ ඉන්න ප්‍රභුවරයෙක්. ඒ පොතේ කියවෙනවා කිසි යම් ප්‍රභුවරයෙකුගේ මරණය ගැන. පොත ලියන කාලේ මේ මා කියන ප්‍රභුවරයා තමයි මගේ හිතේ ඇඳී තිබුණු චිත්ත රූපය. නමුත් ඔහුගේ චරිතයේ අඩංගු හැම දෙයක් ම පොතේ රාජතිලක රාළහාමි ළඟ නෑ. යම් යම් දේවල් ගත්තා. ඔහු අශ්ව කරත්තේ යනවා. බක්කි කරත්තේ යනවා. උත්සව සභා, අවමංගල සභා ආදියේ කතා පවත්වනවා. හැම දෙනාට ම සලකනවා. මේවා අර ප්‍රභුවරයා ළඟත් තිබුණා. මීට අමතරව යම් යම් දේත් රාජතිලකගේ චරිතයේ තියෙනවා. අමුතුවෙන් එකතු කරපු දේවල්. රාජසිංහ රජ්ජුරුවෝ මම දැකලා නෑ. පොත්වල කියවලා තියෙනවා. ජනප්‍රවාදයක් තියෙනවා, රාජසිංහ රජ්ජුරුවෝ කුළු මී හරකෙකුගේ අං දෙකෙන් අල්ලලා මෙල්ල කළා කියලා. මගේ පොතේ රාළහාමිත් මේ වාගේ හපන්කම් කරනවා. පොතේ හැටියට රාළහාමි මළාට පසුව 'රහත් ගුණ' තියෙනවා කියලා මිනිස්සු කියන්ට පටන් ගන්නවා. මේ වාගේ අයට රහත් ගුණ ඇති වෙන්නෙ නැති බව මම දන්නවා. ඒත් රාළහාමි ළඟ රහත් ගුණ තියෙන බව කියා තියෙනවා. මේ රාළහාමි වෙනත් ගෑනියක සමග හාදකම් පැවැත්වූ බව කවි පොතේ කියනවා. ඇගේ නම සිරිපිනා. මා කලින් කියූ අර ප්‍රභුවරයාට නම් අනියම් බිරිඳක් හිටි බවක් මා අහලා නෑ. මේ ප්‍රභුවරයා මත්පැන් පානය කරන්නෙත් නෑ. නමුත් රාජතිලක මත්පැන් බොනවා. මා කියන පුද්ගලයා අංශබාගේ හැදිලා නො වෙයි මළේ. රාජතිලක මැරෙන්නෙ අංශබාගෙන් බව කවි පොත කියනවා. දැන් පෙනෙනවා ඇති රාජතිලක රාළහාමිගේ චරිතය නිර්මාණය කිරීමේ දී අර එක් හැබෑ පුද්ගලයෙක් ගැන පමණක් නො ව වෙනත් අය ගැනත් සිතූ බව. අමුතුවෙන් එකතු කරපු දේත් තියනවා...

...මට අද විශේෂයෙන් පැවරී තියෙනවා එක් කවි පංතියක් ගැන වැඩියෙන් යමක් කීමට. මා තෝරා ගත්තේ 'හඳ සහ නිව්යෝර්ක් නුවර' කියන කවි පෙළයි. මේ ගැන දැන් මම කතා කරන්නම්. ඒ කවි පෙළ මෙහෙමයි.

**හඳ සහ නිව්යෝර්ක් නුවර**

කලු ගැහී තරගයට ඉහළ ගිය
සිමෙන්ති බිත්ති මිසක
ඇසට නිලට
අහසක් ගහක් කොළක
අවටක් නැත.

නිව්යෝර්ක් නම් පුරවර
සියක් මහල් එක් ටැම් ගෙය මුදුනේ
දොර ජනෙල් වසා සිර කළ කාමරයක
ඇඳක් - පුටුවක් - මේසයක්
මම.

මහ පොළොවේ අනිත් පැත්තෙ
සෙනෙහැති දෙමාපියන්
නෑ මිතුරන් අඹු දරුවන්
මට සිහි වෙයි.
පලවන්නට මළ පාළුව
කවියක් හඬ නගා කියමි.
නින්නාදව ආපසු එයි මගෙ කට හඬ
මගෙ කනටම.
යා යුතු අතක් නො දැන

කවුළුව හැර එබී බලමි.
ප්‍රපාතයට එබී බලමි.
මූණට කටු ඇන ගෙන
සීතල කඩා පනින

අසු වී විදුලි එළිය පිටාරයට
මොර දී ගෙන යයි වාහන ඒ මේ අත
ඉවසිල්ලක් නො මැතිව
දිව ගෙන යයි ඒ මේ අත

කුරා කුහුඹු මිනිස් යන්ත්‍ර
මොහොතක් නැවතී මා දෙස
ආදරයෙන් බලන කෙනෙක්
වගතුග අසන කෙනෙක්
දන්නා අඳුනන්නෙක්
මෙතන නො මැත
ඒ හැම දෙන මහ පොළොවේ අනිත් පැත්තෙ
මට සිහි වෙයි.

මහා දුකින් ඉහළ බලමි.
දිලිහි දිලිහි ආකාසේ
රන් පිඟාන සේ
හඳ.
මා දන්නා අඳුනන
අපේ ගමේ වෙල් එළියට පායන හඳ
පෝය දාට බෝ මළුවට පායන හඳ.

මට එක් අවස්ථාවක දී යන්ට පුළුවන්කම ලැබුණා යම් කිසි කටයුත්තකට ඇමෙරිකාවේ එක්සත් ජාතීන්ගෙ මූලස්ථානයට. මේ කවි පෙළ රචනා කළේ ඒ වෙලාවෙ මගේ හිතේ ඇති වෙච්චි පාළු ගතිය කියන්න යි. අපි දන්නවා මේ පාළුව ගැන කොතෙකුත් අපේ පැල්කවි තියෙනවා.

ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට
කන්නේ කරවලයි රට හාලේ බතට
බොන්නේ බොර දියයි පූරුවෙ කළ පවට
යන්නේ කවදා ද මවුපියො දකින්නට

මේ කවියෙන් කියවෙන්නෙත් තමන් ආදරය කරන අයගෙන් ඈත් වෙලා තනියම ඉන්න කොට හිතට දැනෙන පාළුවයි. ඒ නිසා මගේ මේ කවිපෙළත් එක් අතකින් බලන කොට අමුතු දෙයක් නොවෙයි. මේ පුද්ගලයා ඉන්නේ බොහෝ ඈත රටක. විශාල රටක. ඒකෙ අපේ රටේ වාගෙ නොවෙයි විශාල තරගයක් තියෙනවා. අපේ රටෙත් මේ තරගය තියෙන නමුත් අමෙරිකාව වැනි රටක මේ තරගය බොහෝ ම බරපතළ යි. මේ තරගෙදි මිනිස්සු යන්ත්‍ර වගේ, මැෂින් වගේ එහෙ මෙහෙ දුවනවා. එක මොහොතක් තව කෙනෙක් එක්ක වචනයක් කතා කරන්න වෙලාවක් නෑ. ඉස්පාසුවක් නෑ. අපි ජීවත් වෙන්නෙ මීට වඩා වෙනස් පරිසරයක. අපි දවස ගෙවන්නෙ කාලසටහනකට අනුව දවස බෙදා ගෙන නො වෙයි. අපට ඕනෑ තරම් විවේක තියෙනවා. ඒ රටවල එහෙම විවේකයක් නෑ. මේ මට පෙනුණු හැටි. ඒ අය හිත් පිත් නැති යන්ත්‍ර බවට පත් වෙලා ඉන්නෙ. මේක තමා ඒ රටේ දියුණුව. සෞභාග්‍යය. ඇහැට පේන්ට ගහක් කොළක්, අහසක්, ඉඩක් නෑ, තට්ටු හැට හැත්තෑව, ඊටත් වැඩි උස ගොඩනැගිලි. අහසක් පේන්නෙ වත් නෑ. සියලු දේ ම බිත්තිවලින් හිර වෙලා. මේ පුද්ගලයා මේ බිත්ති අතරෙ හිර වෙලා තනිය ම ඉන්නවා, දොර ජනෙල් වැසූ කාමරයක. සීතල සුළඟ නිසා දොරක් ජනේලයක් අරින්න බෑ.

කවියෙ තියෙන්නෙ ‘දොර ජනෙල් වසා සිර කළ කාමරයක ඇඳක් - පුටුවක් - මේසයක් - මම’ කියලා යි. ඒ කාමරයේ තනියම මම ඉන්න බව නො කියා මගේ පාළුවට ඇඳක් පුටුවක් මේසයක් තිබෙන බව කියනවා. මෙයින් මා අදහස් කළේ මේ පුද්ගලයාගේ පාළුව කැපිලා පෙන්නන්නටයි. ඔය කාමරේ තනිය ම ඉන්න වෙලාවේ මා ඇත්තට ම කවියක් කීවේ නෑ. නමුත් කවියේ තියෙනවා ඒ පුද්ගලයා කවියක් කියූ බව. ඔහු කවියක් කියන්නෙත් පාළුව උහුලා

ගන්න බැරුව යි. මෙහෙම කාමරයට හිර වෙලා තනිකම දරා ගන්න බැරි තැන ඔහු එළියෙ තියෙන කටුක සීතල ආවත් කමක් නෑ කියලා ජනේලයක් අරිනවා. ජනේලය ඇරලා පහළට ඔළුව දානවා. මනුෂ්‍ය ප්‍රවාහය සිත්පිත් නැති වාහනවලින් එහාට මෙහාට දුවනවා. විදුලි වාගේ දුවනව පේනවා. නමුත් මෙයාට වචනයක් කතා කරන්න හිතවත් කෙනෙක් නෑ. මෙයාට හිතෙනවා මා දන්නා අඳුනන උදවිය, මගේ දෙමවුපියන්, නෑදෑයන් ඉන්නෙ පොළොවෙ අනික් පැත්තෙ නේ ද? මා තනියම ඉන්නෙ කොච්චර ඈත ද? ඊ ළඟට ඔහු මහා දුකකින් ඉහළ බලනවා. ඉහළින් හඳක් පේනවා. ඔහුට හිතෙනවා මේ හඳ නේ ද ගෙදරදීත් දකින්නෙ? ගමේදීත්, බෝ මළුවෙදීත් පායන හඳ. හොඳ යාළුවෙක් හමු වුණා වාගෙ හැඟීමක් මේ පුද්ගලයට ඇති වෙනවා. මේ කවියෙන් කියන්ට වෑයම් කරන්නේ මේ ටික යි.

**නිර්මාණ පසුබිම - ඒ.වී. සුරවීර**

ඉහත දක්වන ලද්දේ ලේඛකයන් විසින් සිය නිර්මාණවලට පාදක වූ අත්දැකීම් මෙන් ම ඒ ඒ නිර්මාණ පිළිබඳවත් දක්වන ලද අදහස් කිහිපයකි. පාඩමෙහි සඳහන් කළ නිර්මාණ සොයා ගෙන කියවා ඒ ඒ ලේඛකයා මෙහි විස්තර කර ඇති අත්දැකීම් පාදක කර ගනිමින් විවිධ භාෂා ප්‍රයෝග, ප්‍රකාශන විලාස හා රචනා රීති උපයෝග කර ගනිමින් තම අත්දැකීම් පරිපූර්ණ කලා නිර්මාණ බවට පත් කර ඇති ආකාරය ඔබට අවබෝධ කර ගත හැකි ය. නිර්මාණ කාර්යය යනු කලාකරුවා සිය අත්දැකීම් ඇසුරෙන් තමා ලද වින්දනයක් අන්‍යයන් වෙත ඉදිරිපත් කිරීමකි. එම වින්දනය මාර්ගයෙන් විවිධ තලවල පසු වන්නන් එකට සම්බන්ධ වන බවත් ඒ සඳහා කලාකරුවන් යොදා ගන්නා විවිධ ප්‍රයෝග හා උපක්‍රමත් වටහා ගැනීම මගින් අනාගතයේ ඔබ අතුරින් ද සාර්ථක ලේඛකයන් බිහි වනු ඇත.

## අවබෝධය

1. හොඳ නිර්මාණයක් බිහි වීමට අත්දැකීම් සමග සංකලනය කළ යුතු අනෙක් සාධකය කුමක් ද?
2. අත්දැකීමක විශ්වසනීයත්වය යනු කුමක් ද?
3. ලේඛකයාට ලැබෙන අත්දැකීම් වර්ග දෙක මොනවා ද?
4. කාව්‍යයට වස්තු විය හැකි වෙනත් සාහිත්‍යමය මාධ්‍ය දෙකක් පාඩමෙන් උපුටා දක්වන්න.
5. කලාකරුවකුට සහෘදයකු විය හැක්කේ කෙබඳු පුද්ගලයකුට ද?

## ලිඛිත අභ්‍යාස

**1. පාඩමෙන් උපුටා ගත් පහත දැක්වෙන ඡේදය ලේඛන ව්‍යවහාරයට හරවා ලියන්න.**

බොහෝ කතා අපේ හිතට එන්නේ කෙසේ ද කියලා ප්‍රශ්නයක් අහන්ට පුළුවන්. ඒ කොහොම ද කියා හරියට කියන්ට බෑ. සමහර විට ක්ෂණිකව අහසින් හෙණ ගෙඩියක් එන්නා වාගෙ. අපට නො දැනෙන හැඟීම් තියෙනවා අප තුළ. ආසාවල් තියෙනවා. මේවා කොතන තියෙනවා ද කියා කියන්ට බෑ. අවිඥානිකව පහළ වෙනවා කියලා හිතන්ටත් පුළුවනි. එදිනෙදා ජීවිතේ අත්දැකීම් ඇති වෙනවා. අපි හිතමු මිනිහෙක් කෙනෙකුට තඩිබානවා. නැත්නම් අම්මා කෙනෙක් දරුවෙක් මැරිලා අඬනවා. ළමයෙක් කාර් එකක හැපෙනවා. මේ ඔක්කොම සමාජ අත්දැකීම්. මේ අනුව අපේ අත්දැකීම් කොටස් දෙකකට බෙදන්ට පුළුවනි. පුද්ගල අත්දැකීම් හෙවත් ලේඛක අත්දැකීම් එක් කොටසක්. අනෙක් කොටස තමා සමාජ අත්දැකීම්. මේ අත්දැකීම් දෙවර්ගයෙන් ම ලේඛකයා ප්‍රයෝජන ගන්නවා. නිර්මාණ කිරීමට මේ අත්දැකීම් පමණක් මදි. පුළුවන් තරම් පොත් කියවලා දැනුම ලබා ගන්ට ඕනෑ.

## ප්‍රායෝගික අභ්‍යාස

1. ඔබ ලැබූ සතුටුදායක අත්දැකීමක් හා දුක්බදායක අත්දැකීමක් වස්තු විෂය කරගෙන පද්‍ය පන්ති දෙකක් නිර්මාණය කරන්න.
2. ඔබේ මුල් ම ගුරුතුමිය ස්මරණය කරමින් පාසල් බිත්ති පුවත්පතෙහි පළ කිරීම පිණිස පද්‍ය නිර්මාණයක් රචනා කරන්න.
3. සිසුන් කණ්ඩායම් හතරකට බෙදී ප්‍රේමය, සොබාදහම, සමාජ ප්‍රශ්න, ගැමි දිවිය යන තේමා යටතේ ජාතික පුවත්පත් හා සඟරාවල පළ වූ කවි එක් රැස් කර පන්තියට ඉදිරිපත් කරන්න.